Australian Government

Department of Home Affairs

# Privacy notice

# පුද්ගලිකතා දැන්වීම

Form
**1442i SIN**
SINHALESE

Department of Home Affairs (the Department) (ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව) යන්නට ඕස්ට්‍රේලියානු දේශසීමා බලකායද (Australian Border Force) ඇතුලත්වේ. දෙපාර්තමේන්තුව මගින් පුද්ගලයන් සම්බන්ධ යම් පුද්ගලික තොරතුරු රැස්කරන අවස්ථාවලදී ඒ සම්බන්ධයන් ඔවුන් හට දැනුම් දීමට The *Privacy Act 1988* (Privacy Act) (*1988 පුද්ගලිකතා පනත* (පුද්ගලිකතා පනත)) මගින් අවශ්‍යතාවයක් ඇති කරයි. මෙම ආකෘතිය මගින් එම කරුණු සම්බන්ධයෙන් ඔබට දැනුම් දීමක් සිදු කෙරේ.

## පුද්ගලික තොරතුරු යනු මොනවාද?

පුද්ගලිකතා පනත මගින් දක්වන ආකාරයට පුද්ගලික තොරතුරු යනු යම් පුද්ගලයෙකුව සාධාරණ ලෙස හඳුනාගත හැකි ආකාරයට ඇති තොරතුරක් හෝ යම් පුද්ගලයෙකු සම්බන්ධ මතයක්.

දෙපාර්තමේන්තුව මගින් සමහර සංවේදී පුද්ගලික තොරතුරු රැස්කෙරේ. පුද්ගලයෙකුගේ වාර්ගික හෝ ජාතික සම්භවය, ලිංගිකත්වය හෝ ඒ හා සම්බන්ධ පුහුණු, අපරාධ වාර්තා, සෞඛ්‍යය තොරතුරු සහ ජීවමිතික තොරතුරු, වෘත්තීය හෝ ශිල්පීය සංවිධානවල සාමාජිකත්වය, ආගමික විශ්වාස හෝ සබඳතා, දාර්ශනික විශ්වාස, දේශපාලනික සංවිධානවල සාමාජිකත්වය ආදී තොරතුරු ඇතුළු පුද්ගලිකතා පනත යටතේ නිර්වචනය කර ඇති තොරතුරු මෙම තොරතුරුවලට ඇතුලත්වේ.

දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලබන නීතීන් වන්නේ *Migration Act 1958* (the Migration Act) (*1958 සංක්‍රමණ පනත* (සංක්‍රමණ පනත)) *Customs Act 1901* (the Customs Act) *(1901 රේගු පනත (රේගු පනත)), Immigration (Guardianship of Children) Act 1946* (the IGOC Act) (*1946 සංක්‍රමණ (ළමා භාරකාරත්ව) පනත* (IGOC පනත)), *Excise Act 1901* (the Excise Act) (*1901 සුරාබදු පනත* (සුරාබදු පනත)), *Australian Border Force Act 2015* (the Border Force Act) *2015 ඕස්ට්‍රේලියානු දේශසීමා බලකා පනත* (දේශසීමා බලකා පනත)), *Maritime Powers Act 2013* (Maritime Powers Act) *2013 සමුද්‍රීය බලතල පනත* (සමුද්‍රීය බලතල පනත)), සහ *Australian Citizenship Act 2007* (the Citizenship Act) (*2007 ඕස්ට්‍රේලියානු පුරවැසි පනත* (පුරවැසි පනත)) වේ.

## පුද්ගලික හඳුනාගැනීම්

ජීවමිතික (පුද්ගලික හඳුනාගැනීම් ලෙසද හඳුන්වන) ආදී සංවේදී තොරතුරු ඇතුලත් ඔබගේ පුද්ගලික තොරතුරු රැස්කිරීම, භාවිතය, සහ/හෝ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් සංක්‍රමණ සහ පුරවැසි පනත්හි විශේෂිත ප්‍රතිපාදන ඇතුලත්ව ඇත.

පනත මගින් පුද්ගලික හඳුනාගැනීම් පහත ආකාරයට අර්ථදක්වා ඇත:

- ඇඟිලි සලකුණු හෝ අත් සළකුණු
- මුහුණේ සහ උරහිස්වල ප්‍රතිරූපයක්
- ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය තැටිගතකිරීමක් (සමහර සීමාකිරීම්වලට යටත්ව සංක්‍රමණ පනතේ අරමුණු සඳහා පමණක්)
- උස සහ බර සහිත මිනුමක්
- අයිරිස් (iris) ස්කෑනයක්
- පුද්ගලයෙකුගේ අත්සන, හෝ
- රෙගුලාසි මගින් නියම කරන ලද වෙනත් ඕනෑම හඳුනාගැනීමක්.

පහත අවස්ථාවල ජීවමිතික තොරතුරු (පුද්ගලික හඳුනාගැනීම්) පුද්ගලයන්ගෙන් රැස්කිරීම සහ/හෝ නිවැරදිබව බැලීම කල හැකිය:

- ගමන් කරන විට ගුවන් තොටුපලවලදී
- රටතුල සිට වීසා බලපත්‍ර සඳහා අයදුම් කරන විට (ආරක්ෂණ වීසා බලපත්‍ර සඳහා අයදුම් කරන අය ඇතුළුව)
- ඕස්ට්‍රේලියානු ප්‍රජාව තුල සිටින පුරවැසියන් නොවන අය
- සංක්‍රමණ රැඳවුම්කරුවන්
- ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය සඳහා අයදුම්කරන අය.

## දෙපාර්තමේන්තුව කරන්නේ කුමක්ද සහ අපගේ සම්බන්ධතා තොරතුරු

දෙපාර්තමේන්තුවේ මෙහෙවර වන්නේ ඕස්ට්‍රේලියාවේ දේශසීමා ආරක්ෂාකර ඕස්ට්‍රේලියාව ඔස්සේ මිනිසුන් සහ භාණ්ඩ එහාමෙහා යාම කළමණාකරණයට පහත ආකාරයට දායකවී සාක්ෂාත් කර ගැනීමවේ:

- කළමණාකරණය කල සංක්‍රමණය මගින් ඕස්ට්‍රේලියාවේ අනාගතය
- සරණාගතයන් ආරක්ෂා කිරීම සහ ජාත්‍යන්තර වශයෙන් මානවහිතවාදී ප්‍රතිපත්තියට දායකවීම
- දේශසීමා කළමණාකරනය සහ මගීන් එහා මෙහා යාම පහසු කිරීම මගින් ඕස්ට්‍රේලියාවේ ආරක්ෂාව
- දේශසීමා ආදායම සහ වෙළඳ සංඛ්‍යාලේඛණ රැස්කිරීම
- නීත්‍යානුකුල වෙළඳාම පහසු කිරීම
- ඕස්ට්‍රේලියාවේ සමුද්‍රීය ආරක්ෂාව සහ වාණිජ උනන්දුන්
- ඕස්ට්‍රේලියානු ආගමන නීතිවලට අනුව කටයුතු කිරීම සහ තීරණ ගැනීමේ ඒකාග්‍රතාවය
- ඕස්ට්‍රේලියානු පුරවැසි නීති පරිපාලනය කිරීම.

සම්බන්ධවීම සඳහා සියළු විස්තර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන **www.homeaffairs.gov.au** වෙතින් ලබාගත හැකිය.

ඔබගේ තොරතුරු වැරදි ආකාරයට රැස්කර හෝ පරිහරනය කර ඇති බවට ඔබ විශ්වාස කරයි නම්, ඔබට පහත දේ කල හැකිය:

- **www.homeaffairs.gov.au/feedback** වෙබ් අඩවියෙහි ඇති අදහස් දැක්වීමේ ආකෘතියක් මාර්ගගතව සම්පූර්ණ කරන්න
- ලියන්න:

  The Manager
  Global Feedback Unit
  GPO Box 241
  Melbourne VIC 3001
  Australia

## ඔබගේ පුද්ගලික තොරතුරු දෙපාර්තමේන්තුව රැස් කරන්නේ කාගෙන්ද

සාමාන්‍යයෙන්, දෙපාර්තමේන්තුව (හෝ එය සමඟ ගිවිසගත් සේවා සපයන්නන්) ඔබගේ පුද්ගලික තොරතුරු කෙළින්ම ඔබගෙන් හෝ, ඔබ වෙනුවෙන් කටයුතු කිරීමට ඔබ විසින් අනුමැතිය ලබාදුන් තුන්වන පාර්ශවයක් මගින් හෝ සංක්‍රමණ පනත යටතේ නිර්වචනය කර ඇති බලයලත් ක්‍රමයක් මගින් හෝ ලබාගනු ඇත. බලයලත් ක්‍රම අතරට ස්මාර්ට්ගේට් සහ වෙනත් ස්වයංක්‍රීය දේශසීමා නිශ්කාශණ ක්‍රම ඇතුලත්වේ. අප හට ඔබගේ තොරතුරු තුන්වන පාර්ශවයන් මගින්ද රැස්කර ගත හැකි අතර මේවා අතර වෙනත් ඕස්ට්‍රේලියානු රජයේ ආයතන, නීති ක්‍රියාත්මක කරන ආයතන, විදේශ රජයන්, ඔබ විසින් නම් කරන ලද සංවිධාන, අධ්‍යාපන සේවා සපයන්නන්, සේවායෝජකයන් සහ තොරතුරු සහිතව දෙපාර්තමේන්තුව හා සම්බන්ධවන මහජනතාව (උදා: කේළාම් දූරකථන ඇමතුම් (dob-in calls)).

### සංක්‍රමණ සේවා ඉටුකරන ආයතන හෝ ගිවිසුම්කරුවන්

සමහර පුද්ගලික තොරතුරු රැස්කිරීම සහ භාවිතා කිරීම දෙපාර්තමේන්තුවේ ක්‍රියාවන් කිරීමට අධිකාරිය ඇති වෙනත් රජයේ ආයතන මගින් අප වෙනුවෙන් සිදු කෙරේ.

පුද්ගලික තොරතුරු රැස්කිරීම සහ භාවිතා කිරීම අප වෙනුවෙන් අපගේ ගිවිසුම්කරුන් මගින්ද සිදු කෙරේ. උදාහරණ අතර රට තුලට පැමිණෙන සහ රටින් පිටතට යන ගුවන් යානා සම්බන්ධයෙන් ගුවන් සේවා මගින් ගුවන් මගීන්ව පිරිසැකසුම්වලට ලක් කිරීම, පරිගණක පද්ධති, පර්යේෂණ සමීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ, සංක්‍රමණ රැඳවුම්කරුවන් සඳහා උපකාර සේවා.

ගිවිසුම්කරුවන් ඕස්ට්‍රේලියාවේ හෝ වෙනත් රටක කටයුතු කලද ඔවුන් විසින්ද පුද්ගලිකතා පනතට අනුව කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයවේ.

© COMMONWEALTH OF AUSTRALIA, 2020

## නීතිය මගින් අවශ්‍ය ආකාරයට සහ බලය ලබාදී ඇති ආකාරයට ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කිරීම

සංක්‍රමණ පනත, IGOC පනත, රේගු පනත, සුරාබද්ධ පනත, සමුද්‍රීය බලතල පනත, පුරවැසි පනත සහ පුද්ගලිකතා පනත මගින් දෙපාර්තමේන්තුව හට යම් පුද්ගලික තොරතුරු රැස් කිරීමට මෙම පනත් මගින් බලය ලබාදෙන අතර සමහර අවස්ථාවල එසේ කිරීමට අවශ්‍යවේ.

### සංක්‍රමණ පනත

වීසා බලපත්‍ර සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව හට:

- වීසා අයදුම්පත්‍ර සම්බන්ධයෙන් අවශ්‍ය ඕනෑම තොරතුරක් රැස්කිරීමට බලය ඇත (සංක්‍රමණ පනතේ 56 වන වගන්තිය බලන්න), එමෙන්ම
- ඔබ විසින් පුද්ගලික හඳුනා ගැනීමක් ලබාදීමට අවශ්‍ය විය හැකිය (සංක්‍රමණ පනතේ 40 සහ 46 වගන්ති බලන්න).

අයදුම් පත්‍රයක ලබාදුන් තොරතුරුවල වෙනස්වීමක් හෝ සාවද්‍ය තොරතුරු සම්බන්ධයෙන් වීසා බලපත්‍ර අයදුම්කරුවන් හෝ වීසා බලපත්‍රධාරීන් විසින් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දිය යුතුය (සංක්‍රමණ පනතේ 104 සහ 105 වගන්ති).

සංක්‍රමණ පනතේ සහ 1994 සංක්‍රමණ රෙගුලාසිවල අරමුණු සඳහා දෙපාර්තමේන්තුව මගින් ඔබ විසින් පුද්ගලික හඳුනාගැනීම් එකක් හෝ වැඩි ගණනක් ලබාදීම අවශ්‍ය විය හැකිය.

ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණෙන විට ඔබ විසින් යම් පුද්ගලික තොරතුරු ලබාදීම දෙපර්තමේන්තුවේ අවශ්‍යතාවයවේ (උදහරණ වශයෙන් පුරවැසියන් සඳහා ගමන් බලපත්‍රය, සහ පුරවැසියන නොවන අය සඳහා අනන්‍යතා සනාථ කරන ලියකියවිලි සහ වීසා බලපත්‍රය). ඔබ පුරවැසියෙකු නොවන අයෙකු නම් සහ අවශ්‍ය සනාථ කරන ලියකියවිලි ඔබ විසින් එවා ලබා නොදුනහොත්, ඔබට ඕස්ට්‍රේලියාවට එමට ඉඩ ලබා නොදෙනු ඇත (සංක්‍රමණ පනතේ 257A වගන්තිය බලන්න).

ඔබ ඕස්ට්‍රේලියාව හැරයනවිට, ඔබ විසින් යම් පුද්ගලික හඳුනා ගැනීම් දෙපාර්තමේන්තුව හට ලබා දිය යුතුය (සංක්‍රමණ පනතේ 257A වගන්තිය බලන්න).

නීතිවිරෝධී පුරවැසියන් හඳුනා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව හට පහත දේ ලබාදෙන ලෙස ඉල්ලා සිටිය හැකිය:

- පුද්ගලික හඳුනාගැනීමක් ඇතුළුව අනන්‍යතාවය සහ වීසා තත්වය (සංක්‍රමණ පනතේ 188 වගන්ති බලන්න)
- නීතිවිරෝධී පුරවැසියෙකු ලෙස සැක කරනු ලබන පුද්ගලයෙකුගේ අනන්‍යතාවය සහ ඔවුන් සිටින ස්ථානය සම්බන්ධ ලියකියවිලි හෝ තොරතුරු ලබා දෙන ලෙස පුද්ගලයෙකුගෙන් ඉල්ලා සිටීම (සංක්‍රමණ පනතේ 18වන වගන්තිය බලන්න).

සංක්‍රමණ රැඳවුමක සිටින පුද්ගලයෙකු විසින් පුද්ගලික හඳුනාගැනීම් ලබාදිය යුතුය (සංක්‍රමණ පනතේ 258 සහ 261AA(1) වගන්ති සහ සංක්‍රමණ රෙගුලාසි 3.30 බලන්න)

දෙපාර්තමේන්තුව සහ Fair Work Ombudsman (FWO) (සාධාරණ රාජකාරි සම්බන්ධ ඔම්බඩ්ස්මන්වරයා (FWO)) මගින් ව්‍යාපාර අනුග්‍රාහකයන් සම්බන්ධ විස්තර සංක්‍රමණ පනතේ 2 වන කොටසේ 3A කොට්ඨාශයේ F උප කොට්ඨාශය අනුව පරීක්ෂණ බලතල සම්බන්ධයෙන් පුද්ගලික තොරතුරු රැස්කර ගත හැකිය.

සංක්‍රමණ පනතේ 252 වන වගන්තිය යටතේ ඇති සෙවුම සඳහාවූ බලතලවල අරමුණු සඳහා, බලයලත් නිලධාරියෙකු හට යම් පුද්ගලයෙකුගේ ශරීරයේ හෝ සන්තකයේ ඇති ලේඛණයක් හෝ වෙනත් දෙයක් රඳවා තබා ගත හැකිය. උදාහරණ ලෙස මෙය අදාල පුද්ගලයාගේ වීසා බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධ සාක්ෂි වශයෙන්.

ව්‍යාජ ලේඛණයක් නිලධාරියෙකු හට සිය සන්තකයට ගත හැකිය (ලේඛණ සම්බන්ධයෙන් කුමන ආකාරයට කටයුතු කල යුතුද යන්න ඇතුළුව සම්බන්ධයෙන් සංක්‍රමණ පනතේ 9 වන කොටසේ 1 වන කොට්ඨාශයේ 487ZJ වගන්තිය බලන්න).

### පුරවැසි පනත

යම් පුද්ගලයෙකු පුරවැසි අවශ්‍යතාවයන් සපුරාලීම සම්බන්ධයෙන් සනාථ කර ගැනීමට දෙපාර්තමේන්තුව මගින් පුද්ගලික තොරතුරු ගණනාවක් රැස්කල හැකිය.

පුරවැසි අයදුම්පත් සම්බන්ධයෙන් පුද්ගලික හඳුනාගැනීම් ඉල්ලා සිටීමට අපට බලය ඇති අතර ඔබගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් තීරණය ගන්නා අය සෑහීමට පත් නොවන්නේ නම්, අයදුම්පත්‍රය අනුමත කල නොහැකිය (පුරවැසි පනතේ 2 වන කොටසේ 5 කොට්ඨාශයේ 17(3), 19D(4), 24(3), සහ 30(3) බලන්න).

ව්‍යාජ ලේඛණයක් නියෝජිතයකු හට සිය සන්තකයට ගත හැකිය (ලේඛණ සම්බන්ධයෙන් කුමන ආකාරයට කටයුතු කල යුතුද යන්න ඇතුළුව සම්බන්ධයෙන් පුරවැසි පනතේ 3 වන කොටසේ 1 වන කොට්ඨාශයේ 45B වගන්තිය බලන්න).

### IGOC පනත

*Immigration (Guardianship of Children) Act 1946* (the IGOC Act) (*1964 සංක්‍රමණ (ළමුන්ගේ භාරකත්ව) පනත* (IGOC පනත)) සහ අදාල රෙගුලාසි යටතේ දෙමාපියකු හෝ වයස අවුරුදු 21 ට වැඩි ඥාතියෙකු නොමැතිව ඕස්ට්‍රේලියාව වෙත පැමිණෙන සමහර පුරවැසියෙකු නොවන බාලවයස්කරුවන්ගේ භාරකරු වන්නේ සංක්‍රමණ අමාත්‍යවරයාය (IGOC බාලවයස්කරුවන් ලෙස හැදින්වේ). භාරකාර වගකීම් සපුරාලීමට උපකාර කිරීම සඳහා, IGOC පනත මගින් අමාත්‍යවරයා හට සිය බලතල සහ කාර්‍යයන් කොමන්වෙල්ත් හෝ ප්‍රාන්ත හෝ ටෙරිටරි රාජ්‍යයන්හි නිලධාරීන් හට පැවරීමට ඉඩකඩ සලසාදේ (බලතල පැවරූ භාරකරුවන් ලෙස හැදින්වේ). කැමති සහ සුදුසු පුද්ගලයන් හෝ සංවිධානද IGOC බාලවයස්කරුවන්ගේ භාරකරුවන් ලෙස පත්කල හැකිය. සාමාන්‍ය ආකාරයට, භාරකරුවකු හට සිය භාරකාරත්වයේ සිටින දරුවෙකුගේ දිනපතා රැකවරණය සහ පාලනය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය සහ වගකීම තිබේ.

IGOC පනත යටතේ සිටින දරුවන්ගේ දිනපතා රැකවරණය සහ සුබසාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා, දෙපාර්තමේන්තුව මගින් IGOC බාලවයස්කරුවන් සහ ඔවුන්ගේ භාරකරුවන් සම්බන්ධ පුද්ගලික තොරතුරු රැස්කරයි. IGOC බාලවයස්කරුවන්ගේ දිනපතා රැකවරණය සහ සුබසාධන අවශ්‍යතා සපුරාලන බවට වගබලා ගැනීම සඳහා, අවශ්‍ය අවස්ථාවල පුද්ගලිකතා පනතට අනුව දෙපාර්තමේන්තුව මගින් පුද්ගලික තොරතුරු පහත ආයතනවලට හෙළිදරව් කල හැකි අතර  එම ආයතනවලින් ලබාගත හැකිය:

- ළමා සුබසාධන ආයතන ඇතුළු ප්‍රාන්ත/ටෙරිටරි අධිකාරීන්
- බලයලත් භාරකරුවන්
- භාරකරුවන්
- දෙමාපියන්, රැකවරණකරුවන් සහ/හෝ ඥාතීන්, සහ/හෝ
- වෙනත් ඕස්ට්‍රේලියානු රජයේ ආයතන.

### රේගු සහ සුරාබද්ධ පනත

රේගු සහ සුරාබද්ධ පනත් සහ වෙනත් අදාල ඕස්ට්‍රේලියානු නීති (සංක්‍රමණ පනත සහ බද්ධ නීති ඇතුළු) පරිපාලනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව හට විවිධ ආකාරයේ පුද්ගලික සහ ව්‍යාපාර තොරතුරු රැස්කිරීමට බලය ඇත. දෙපාර්තමේන්තුව මගින් මෙම තොරතුරු රැස් කරන්නේ විශේෂයෙන් ඕස්ට්‍රේලියාවේ දේශසීමා ආරක්ෂා කිරීම සහ දේශසීමා ආදායම රැස්කිරීම සාක්ෂාත් කරගැනීම සඳහාවේ.

සමහර අවස්ථාවල, රේගු සහ සුරාබද්ධ පනත් සහ බද්ධ නීති යටතේ ඇතිවන අවශ්‍යතා සඳහා පුද්ගලික තොරතුරු රැස් කිරීම සඳහාවූ පෝරමවල සුවිශේෂ රැස්කිරීමේ දැන්වීම්ද ඇතුලත් විය හැකිය. මෙම පෝරම තුල එම ලියකියවිලි මගින් රැස්කරන පුද්ගලික තොරතුරු රැස්කිරීම, භාවිතා කිරීම සහ හෙළිදරව් කිරීම සම්බන්ධ විශේෂිත තොරතුරුද ඔබට ලබාදෙන අතර එවා කියවන විට මෙම පුද්ගලිකතා දැන්වීම සමඟ කියවිය යුතුය.

උදාහරණ වශයෙන්, රේගු පනතේ 64ACA සහ 64ACB වගන්ති යටතේ රේගු පනත, සංක්‍රමණ පනත සහ වෙනත් නීතීන් පරිපාලනය කිරීමේ අරමුණු වෙනුවෙන් දෙපාර්තමේන්තුව මගින් ඕස්ට්‍රේලියාව වෙත පැමිණෙන මගීන් සහ නැව් සහ ගුවන්යානාවල කාර්‍ය මණ්ඩලය සම්බන්ධ සමහර පුද්ගලික තොරතුරු රැස්කිරීමට අවශ්‍යවේ.

### සමුද්‍රීය බලතල පනත

ජලයෙහි බලාත්මක කරන ආයතන මගින් සමුද්‍රීය බලතල ක්‍රියාත්මක කිරීමේදී පුද්ගලික තොරතුරු රැස් කිරීමට දෙපාර්තමේන්තුව හට බලය ඇත. මෙම බලතල මගින් නිතිවිරෝධී ලෙස විදේශ මාළු ඇල්ලීම, රේගු, සමුද්‍රයට අදාල ත්‍රස්ත විරෝධී කටයුතු, සංක්‍රමණය, නිරෝධායනය සහ මත්ද්‍රව්‍ය ජාවාරම මෙන්ම ජාත්‍යන්තර ගිවිසුම් සහ මුහුදේ ඇති වැඩපිළිවෙලවල් ඇතුළු ඕස්ට්‍රේලියාවේ සමුද්‍රීය ආශ්‍රිත නීති බලාත්මක කිරීමට උපකාරවේ.

### පුද්ගලිකතා පනත

පුද්ගලිකතා පනත මගින් පහත දේ රැස් කිරීමට බලය ලබාදේ:

- නීතිය මගින් බලය ලබාදී ඇතිවිට, හෝ බලාත්මක කිරීමේ ක්‍රියාවන් සඳහා, හෝ ඔබගේ අනුමැතිය ඇතිව, සංවේදී තොරතුරු
- දෙපාර්තමේන්තුවේ ක්‍රියාවන් හෝ ක්‍රියාකාරකම් එකක් හෝ වැඩි ගණනක් සඳහා සාධාරණ හෝ කෙළින්ම අවශ්‍ය වන වෙනත් පුද්ගලික තොරතුරු.

## දෙපාර්තමේන්තුව නීතිය බලාත්මක කරන ආයතනයක් වන පනත්

පහත පනත්වල සමහර අරමුණු වෙනුවෙන් දෙපාර්තමේන්තුව නීතිය බලාත්මක කිරීමේ ආයතනයක්වේ: *Crimes Act 1914* (*1914 අපරාධ පනත*), *Criminal Code Act 1995* (*1995 අපරාධ සංග්‍රහ පනත*), *Australian Nuclear Science and Technology Organisation Act 1987* (the ANSTO Act) (*1987 ඕස්ට්‍රේලියානු න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණික සංවිධාන පනත* (ANSTO පනත)) සහ *Independent National Security Legislation Monitor Act 2010* (*2010 ස්වාධීන ජාතික ආරක්ෂක ව්‍යවස්ථා උපදේශක පනත*), සහ එම පනත් යටතේ සිය කටයුතු සහ ක්‍රියාකාරකම් ඉටුකිරීමට පුද්ගලික තොරතුරු හෙළිදරව් කල හැකිය.


© COMMONWEALTH OF AUSTRALIA, 2020

## ඔබගේ පුද්ගලික තොරතුරු අප විසින් රැස් කිරීමේ අරමුණ

පුද්ගලික තොරතුරු රැස් කිරීමේ අපගේ මූලික අරමුණ වන්නේ ඔබගේ සංක්‍රමණ සහ/හෝ පුරවැසි කරුණු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු හෝ ක්‍රියාකාරකම් කරගෙන යාම සහ/හෝ දේශසීමාව ඔස්සේ භාණ්ඩ එහා මෙහා ගෙනයාමවේ. අපි පහත වැඩසටහන් කළමණාකරණය කරමු:

- වීසා බලපත්‍ර සහ සංක්‍රමණය
- බදු, සෞඛ්‍යය, නිරෝධායනය, වාණිජ, අපරාධ, බුද්ධිමය දේපළ සහ ප්‍රජා ආරක්ෂණ නීති ඇතුලත් වෙනත් සමහර ඕස්ට්‍රේලියානු නීති පරිපාලනය කරන රේගු සහ සුරාබදු
- සරණාගතයන් සහ මානව හිතවාදී උපකාර
- දේශසීමා  කළමණාකාරණය
- වීසා බලපත්‍රවලට අනුකූලවීම සහ සංක්‍රමණ තත්ව විසඳාලීම
- (නීතිය ක්‍රියාත්මක කිරීම, සුබසාධන සේවා සහ පදිංචිකරවීම සැපයීම ආදී එතෙර සැකසුම් සම්බන්ධයෙන් උපකාර කරන සේවා සපයන්නන් සහ විදේශ අධිකාරීන් ඇතුළු) සංක්‍රමණ රැඳවුම, ඉවත් කිරීම, හෝ ප්‍රාදේශීය පිරිසැකසුම් මධ්‍යසථානයක් (Regional Processing Centre) වෙත භුවමාරුකර යැවීම
- පුරවැසිබව.

වීසා බලපත්‍ර, අනුග්‍රාහක, වෙළඳ, ආනයන සහ අපනයන, නිරෝධායන, හෝ පුරවැසි අයදූම්පත්‍රයක ඔබ විසින් සපයන තොරතුරු ප්‍රාථමික අරමුණවෙනුවෙන් උපයෝගී කරගනු ලැබේ.

පුද්ගලිකතා පනත යටතේ, ද්විතීයික කරුණක් සඳහාද තොරතුරු උපයෝගී කරගත හැකිය. ඔබගේ පුද්ගලික තොරතුරු දෙපාර්තමේන්තුව මගින් භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම කල හැකියැයි ඔබට සාමාන්‍ය වශයෙන් අපේක්ෂා කල හැකි වන්නේ ද්විතීයික අරමුණ ප්‍රාථමික අරමුණ හා කෙළින්ම සම්බන්ධ වන අවස්ථාවල (සංවේදී තොරතුරු) හෝ ප්‍රාථමික අරමුණ හා සම්බන්ධ වන අවස්ථාවලදීය (අනෙක් පුද්ගලික තොරතුරු). උදාහරණ වශයෙන්, වීසා බලපත්‍ර අයදූම්පත්‍රයක ඔබ ලබාදෙන තොරතුරු ඔබ විසින් පසුව ඉදිරිපත් කරන අයදූම්පත්‍රයක් සම්බන්ධයෙන් භාවිතා කල හැකිය *Freedom of Information Act 1982* (*1982 තොරතුරු නිදහසේ ලබා ගැනීමේ පනත)* සහ පුද්ගලිකතා පනත (Privacy Act) යටතේ ඇතුළුව).  තවද ඔබ විසින් සංක්‍රමණ කරුණු සම්බන්ධයෙන් ඔබ හා ඉලෙක්ට්‍රොනිකව සම්බන්ධවීමට  අප වෙත ලබාදුන් සම්බන්ධවීමේ තොරතුරුද අප විසින් භාවිතා කල හැකිය.

## දෙපාර්තමේන්තුව මගින් ඔබගේ පුද්ගලික තොරතුරු රැස් නොකලහොත් ඇතිවන ප්‍රතිපල

ඔබගේ පුද්ගලික තොරතුරු රැස්කර නොගතහොත්, වීසා හෝ පුරවැසි අයදූම්පත්‍රය සලකා බැලීමට හෝ (අවශ්‍ය අවස්ථාවල) ඔබට වෙළඳ, ආනයන, අපනයන සහ නිරෝධායන උපකාර සේවා ලබාදීමට දෙපාර්තමේන්තුවට නොහැකිවේ.

ඔබගේ තොරතුරු රැස්කිරීමට නොහැකිවීම මගින් දෙපාර්තමේන්තුව හට සිය ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කිරීමට (විශේෂයෙන් නීතියට අනුව කටයුතු කිරීමට), සිය සැලකිලිමත්වීම සම්බන්ධ යුතුකම ඉටු කිරීමට, හෝ ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර කැපකිරීම් අනුව කටයුතු කිරීම සීමා විය හැකිය.

## ඔබගේ පුද්ගලික තොරතුරු තුන්වන පාර්ශවයන්  හට සාමාන්‍ය වශයෙන් හෙළිදරව් කිරීම

### නම්කරන ලද නියෝජිතයන් හට හෙළිදරව් කිරීම

පවුලේ සාමාජිකයෙකු, සංක්‍රමණ නියෝජිතයෙකු, රේගු බ්‍රෝකර්වරයෙකු, ගමන් හෝ ගුවන් නියෝජිතයෙකු, ඔම්බඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, හෝ ඔබව නියෝජනය කරන නීතීඥවරයෙකු වැනි අයෙකුව ඔබ නම්කර ඇති අවස්ථාවක ඔබ විසින් ඔවුන් හට ඔබගේ පුද්ගලික තොරතුරු ලබා නොදෙන ලෙස ඉල්ලා සිටි අවස්ථාවල හැර එම තුන්වන පාර්ශවයන් හට ඔබගේ පුද්ගලික තොරතුරු හෙළිදරව් කල හැකිය.

ඔබ අනුග්‍රහය ලබාදෙන අය හෝ ඔබගේ අනුග්‍රාහක හට ඔබගේ පුද්ගලික තොරතුරු හෙළිදරව් කල හැකිය.

### වෙනත් රජයේ ආයතන හට කරන සාමාන්‍ය හෙළිදරව් කිරීම

වෙනත් ඕස්ට්‍රේලියානු රජයේ ආයතන හට ඕස්ට්‍රේලියානු නීතිය යටතේ දෙපාර්තමේන්තුව මගින් යම් පුද්ගලික තොරතුරු ලබාගැනීමට බලය ඇත.

යම් අවස්ථානුගත කරුණු යටතේ සිය රාජකාරි සහ ක්‍රියාකාරකම් පරිපාලනය කිරීමේ අරමුණින් හෝ සිය ක්‍රියාකාරකම් ඉටුකිරීමට වෙනත් ආයතනවලට අවස්ථාව ලබාදීමට හෝ උපකාර කිරීමට දෙපාර්තමේන්තුව විසින් වෙනත් රජයේ ආයතන වෙත පුද්ගලික තොරතුරු හෙළිදරව් කිරීමට දේශසීමා බලකා පනත හෝ වෙනත් ව්‍යවස්ථා යටතේ බලය ඇත. උදාහරණ අතර ඔබගේ අනන්‍යතාවය සනාථ කර ගැනීමට, ඔබ විසින් ලබාදුන් ලියකියවිලිවල නිවැරදිබව තහවුරු කර ගැනීමට, දත්ත ගලපා බැලීමට, හෝ නීතියට අනුකූලව කටයුතු කිරීමේ වගකීම කළමණාකරණය කිරීමට හෙළිදරව් කිරීම.

අප විසින් තොරතුරු හුවමාරු කර ගන්නා රජයේ ආයතන අතර පහත ආයතන ඇති අතර ඒවාට පමණක් සීමා නොවේ:

- *Social Security Act 1991* (*1991 සමාජ ආරක්ෂණ පනත*) පරිපාලනය කිරීමට මානව සේවා දෙපාර්තමේන්තුව (DHS), *Child Support (Assessment) Act 1989* (*1989 ළමා උපකාර (ඇගයීමේ) පනත*) සහ *Child Support (Registration and Collection) Act 1988 (1988 ළමා උපකාර (ලියාපදිංචි සහ රැස් කිරීමේ) පනත))*
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- ඕස්ට්‍රේලියානු ජීව ආරක්ෂක පද්ධතිය කළමණාකරණය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ *Quarantine Act 1908* (*1908 නිරෝධායන පනත*), *Export Control Act 1982*  සහ *Imported Food Control Act 1992* (*1982 අපනයන පාලන පනත*) සහ (*1992 ආනයන ආහාර පාලන පනත*) පරිපාලනය කිරීමට
- විකිත්සීය භාණ්ඩ පරිපාලනය
- කර්මාන්ත, නව්‍යකරණ සහ විද්‍යා  දෙපාර්තමේන්තුව
- National Anti-Doping Scheme (ජාතික මත්ද්‍රව්‍යවලට එරෙහි වැඩපිළිවෙල) පරිපාලනය සඳහා Australian Sports Anti-Doping Authority (ඕස්ට්‍රේලියානු ක්‍රීඩා සම්බන්ධ මත්ද්‍රව්‍යවලට එරෙහි අධිකාරිය)
- *Education Services for Overseas Students Act 2000* (*2000 විදේශ ශිෂ්‍යයන් සඳහා අධ්‍යාපන සේවා පනත*) යටතේ අධ්‍යාපන සේවා පරිපාලනය කිරීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- රැකීරක්ෂා සේවාවල දත්ත ගලපා ගැනීම සඳහා  රැකිරක්ෂා, නිපුනතා, කුඩා සහ පවුල් ව්‍යාපාර දෙපාර්තමේන්තුව
- *Veterans' Entitlements Act 1986* (*1986 පැරණි හමුදා සේවකයන්ගේ හිමිකම් පනත*) පරිපාලනය කිරීම සඳහා පැරණි හමුදා සේවකයන්ගේ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
- *Income Tax Assessment Act 1997* (*1997 ආදායම් බදු තක්සේරු පනත*) සහ වෙනත් බදු ව්‍යවස්ථා පරිපාලනය කිරීම සඳහා ඕස්ට්‍රේලියානු ආදායම් බදු කාර්යාලය (ATO)
- *Fair Work Act 2009* (*2009 සාධාරණ රාජකාරී පනත*) පරිපාලනය සඳහා සාධාරණ රාජකාරී පිළිබඳ ඔම්බඩ්ස්මන්වරයා (FWO)
- *Australian Passport Act 2005* (*2005 ඕස්ට්‍රේලියානු ගමන් බලපත්‍ර පනත*) පරිපාලනය කිරීම සඳහා විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව (DFAT) සහ ආරක්ෂණ වීසා බලපත්‍ර සලකා බැලීම සඳහා සහ ද්විත්ව පුරවැසියෙකු වශයෙන් ඔබට තබා ගැනීමට සුදුසුකම් ඇති විදේශ ගමන් බලපත්‍රයක් සම්බන්ධයෙන් රටවල්වල තොරතුරු ලබාගැනීම සඳහා
- *Commonwealth Electoral Act 1918* (*1918 කොමන්වෙල්ත් මැතිවරණ පනත*) පරිපාලනය කිරීම සඳහා ඕස්ට්‍රේලියානු මැතිවරණ කොමිසම.

### සමාලෝචන, විගණන සහ විමර්ශන ආයතන

ඔබ තීරණයක් සම්බන්ධයෙන් සුදුසුකම් හෝ විනිශ්චය සමාලෝචනයකට (merits or judicial review) අයදුම් කරයි නම්, දෙපාර්තමේන්තුව මගින් සමාලෝචනය පවත්වන විනිශ්චය සභාව හෝ අධිකරණය වෙත අදාල පුද්ගලික තොරතුරු ලබාදෙනු ඇත.

පහත දැක්වෙන විමර්ශන ආයතන සමග අපි තොරතුරු බෙදාහදා ගනිමු:

- කොමන්වෙල්ත් ඔම්බඩ්ස්මන්වරයා
- ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස් කාර්යාලය
- ඕස්ට්‍රේලියානු ජාතික විගණන
- ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම
- ෆෙයාර් වර්ක් ඔම්බඩ්ස්මන්වරයා.

### ආපදාවන් සහ නීතිය බලාත්මක කිරීම

ආපදාවකදී, දරුණු තුවාල හෝ මරණය වැනි අවස්ථාවලදී ඕස්ට්‍රේලියානු නීතිය බලාත්මක කරන ආයතන හෝ ආපදා සේවා හට ඔබගේ පුද්ගලික තොරතුරු ලබාදිය හැකිය.

අපරාධ වැරදි නිවාරණය, සොයා ගැනීම, විමර්ශණය සහ නඩු දැමීම හෝ දඬුවම් කිරීම ඇතුළු බලාත්මක කිරීමට අදාල ක්‍රියාකාරකමක් අවශ්‍ය අවස්ථාවල දෙපාර්තමේන්තුව මගින් ඕස්ට්‍රේලියානු (කොමන්වෙල්ත්, ප්‍රාන්ත සහ ටෙරිටරි) සහ විදේශ  නීතිය බලාත්මක කිරීමේ ආයතන වෙතද තොරතුරු හෙළිදරව් කරනු ඇත.

### සහායක වැඩසටහන්

වීසා බලපත්‍ර සලකා බැලීමේදී ලබාගත් තොරතුරු පහත ආයතන වෙත ලබාදිය හැකිය:

- පදිංචිවීමේ උපකාර ලබාදීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත
- ඉංග්‍රීසි භාෂා පුහුණුව පහසු කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කර්මාන්ත, නව්‍යකරණ සහ විද්‍යා  දෙපාර්තමේන්තුව වෙත

© COMMONWEALTH OF AUSTRALIA, 2020

## බලපත්‍ර ලබාදෙන අධිකාරීන් හට කරන හෙළිදරව් කිරීම

ඔබ ඕස්ට්‍රේලියාවේ බලපත්‍රයකට අයදුම් කරයි නම්, දෙපාර්තමේන්තුව මගින් අදාල අධිකාරීන් හට ඔබගේ සංක්‍රමණ තත්වය, සමහර අවස්ථාවල ඔබට ඕස්ට්‍රේලියානු පුරවැසිබව ලබාදී ඇතිද යන්න බව හෙළිදරව් කල හැකිය. මෙම තොරතුරු මගින් ඔබ විසින් අදාල බලපත්‍රය දැරීමට සුදුසුකම් ඇතිද යන්න සලකා බැලීමට උපයෝගී කරගනු ලැබේ. ඔබ රෙගු පනත යටතේ විශේෂිත බලපත්‍ර සඳහා අයදුම් කරන්නේ නම්, විශේෂිත හෙළිදරව් කිරීම් කල යුතුය.

## පුද්ගලික තොරතුරු හෙළිදරව් කිරීමට අධිකාරිය ඇති අවස්ථා

1 වන පිටුවෙහි පුද්ගලික හඳුනාගැනීම් අර්ථනිරූපණය කර ඇත.

සංක්‍රමණ පනතේ 4A කොටස සහ පුරවැසි පනතේ 43 වන වගන්තිය යටතේ අවස්ථානුගත කරුණු රාශියක් යටතේ දෙපාර්තමේන්තුව මගින් පුද්ගලික හඳුනා ගැනීම් හෙළිදරව් කිරීමට අධිකාරිය ඇත. උදාහරණ අතර පහත දේ ඇත:

- පුරවැසි හෝ වීසා බලපත්‍ර තත්වය නිවැරදිව දැන ගැනීම
- අපරාධ නීතිය බලාත්මක කිරීම
- ඕස්ට්‍රේලියානු රජයේ ආයතන සමග ඇති වැඩපිළිවෙලක් යටතේ හඳුනාගැනීමේ තොරතුරු හුවමාරු කර ගැනීම
- අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ විමර්ශනය කරන ආයතනයකට අදාල තොරතුරු ලබාදීම
- ඕස්ට්‍රේලියානු නීතිය යටතේ අවශ්‍යවන අවස්ථාවල.

පුරවැසි පනත යටතේද පුරවැසි හෝ සංක්‍රමණ ව්‍යවස්ථාවල අරමුණු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව හට පුද්ගලික හඳුනාගැනීම් හෙළිදරව් කිරීමට අධිකාරිය ඇත.

සංක්‍රමණ පනතේ 4A කොටස යටතේ පහත අවස්ථාවලදී පුද්ගලික තොරතුරු (පුද්ගලික හඳුනා ගැනීම් ඇතුළුව) හෙළිදරව් කිරීමට දෙපාර්තමේන්තුව හට අධිකාරිය ඇත:

- පහත කරුණු සඳහා දත්ත ගලපා ගැනීමට:
  - පුද්ගලයෙකුගේ අනන්‍යතාවය හඳුනා ගැනීමට, හෝ සනාථ කර ගැනීමට
  - ඕස්ට්‍රේලියාවට ඇතුළුවන හෝ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යන අයව පිරිසැකසුම් කිරීම පහසු කිරීම
  - අපරාධ ඉතිහාසයක් ඇති, චරිතය ගැන ගැටළුවක් ඇති හෝ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු ඇති පුරවැසියන් නොවන අයව හඳුනා ගැනීම
  - සංක්‍රමණ කටයුතුවලදී ලියකියවිලි සහ අනන්‍යතා වංචාවලට එරෙහිව කටයුතු කිරීම
  - ආරක්ෂණ වීසා බලපත්‍ර පිරිසැකසුම් කිරීමට උපකාර කිරීම
- පුද්ගලයන්ව හඳුනා ගැනීම හෝ සිටින තැන සොයා ගැනීම (සංක්‍රමණ පනතේ 33FA සහ 33FC වගන්තිද බලන්න)
- ඕස්ට්‍රේලියානු ජාතික විගණන කාර්යාලය සහ ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම වැනි විමර්ශන ආයතන නියම කිරීමට
- ඕස්ට්‍රේලියාවෙන් පුද්ගලයෙකු ඉවත් කිරීම හෝ ඕස්ට්‍රේලියාව වෙත හෝ ඕස්ට්‍රේලියාවෙන් පුද්ගලයෙකු උද්ඝපනය කිරීමේ අරමුණු වෙනුවෙන් විදේශ රාජ්‍යයන් සමග කටයුතු පිළියෙල කර ගැනීම සඳහා
- සංක්‍රමණ ගැටළු කළමණාකරණය කිරීමේ අරමුණු වෙනුවෙන් (සංක්‍රමණ පනතේ 5A(3) කොටස බලන්න) නියම කරන ලද විදේශ රාජ්‍යයන්, විදේශ රාජ්‍යවල නීතිය බලාත්මක කරන හෝ දේශසීමා පාලන ආයතන, හෝ නියම කරන ලද ජාත්‍යන්තර සංවිධාන වෙත තොරතුරු ලබාදීම
- ජාත්‍යන්තර අපරාධ කටයුතු සම්බන්ධයෙන් උපකාර ලබාගැනීම හෝ ලබාදීම.

පුද්ගලික හඳුනාගැනීම් සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා 1243i ආකෘතිය බලන්න.

රාජකාරී වීසා බලපත්‍ර සම්බන්ධයෙන් අනුග්‍රාහකයින් හෝ වීසා බලපත්‍රධාරීන් සම්බන්ධ සමහර පුද්ගලික තොරතුරු අනුරූප වීසා බලපත්‍රධාරියා හෝ අනුග්‍රාහක වෙත ලබාදීමටද දෙපාර්තමේන්තුව හට අධිකාරිය ඇත (සංක්‍රමණ පනතේ 140ZH වගන්තිය සහ 2.103, 2.104 සහ 2.105 රෙගුලාසි බලන්න).

දෙපාර්තමේන්තුව මගින් දේශසීමා බලකා පනතේ 6 වන කොටසේ සීමිත අවස්ථා යටතේ දක්වා ඇති සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂණ තොරතුරුද (දේශසීමා බලකා පනතේ 4(1) වගන්තිය බලන්න) හෙළිදරව් කල හැකිය. සමහර අවස්ථානුගත කරුණු යටතේ, දේශසීමා බලකා පනත මගින් පහත ආයතන වෙත තොරතුරු හෙළිදරව් කිරීම අනුමත කරයි:

- කොමන්වෙල්ත්, ප්‍රාන්ත සහ ටෙරිටරි ආයතන හෝ අධිකාරීන්
- ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිසිය (AFP) හෝ ප්‍රාන්තයක හෝ ටෙරිටරියක පොලිස් බලකායක් හෝ සේවාවක්
- මරණ පරීක්ෂක
- කොමන්වෙල්ත්, ප්‍රාන්ත සහ ටෙරිටරිවල ව්‍යවස්ථාපිත නිල තනතුරු දරන්නන් (උදා. ඔම්බඩ්ස්මන්වරයෙකු)
- ඕස්ට්‍රේලියානු රතු කුරුස සමාජය වැනි 2015 ඕස්ට්‍රේලියානු දේශසීමා බලකා (Secrecy and Disclosure) (රහස් සහ හෙළිදරව්) රීතීන් මගින් නියම කරන ලද ආයතන හෝ පුද්ගලයන්
- විදේශ රටවල් හෝ පොදු ජාත්‍යන්තර සංවිධාන.

කෙසේවුවද, දේශසීමා බලකා පනතේ 6වන කොටසේ ඇති වෙනත් නිශ්චිත අවශ්‍යතාවලට අමතරව, දේශසීමා බලකා පනත යටතේ පුද්ගලික තොරතුරු හෙළිදරව් කිරීම අනුමත කරන්නේ ඉහත සඳහන් ආයතනයක් වෙත පමණක් වන අතර දේශසීමා බලකා පනතේ ලැයිස්තුගත කර ඇති බලයලත් අරමුණු එකක් හෝ කිහිපයක් සඳහා පමණි. උදාහරණ අතර පහත දක්වා ඇති අරමුණුවලින් එකක් සඳහා පමණක් හෙළිදරව් කිරීම කල හැකිය:

- අපරාධ නීතිය හෝ වාණිජ සම්බන්ධ නීතිය පරිපාලනය හෝ බලාත්මක කිරීම හෝ
- මරණ පරීක්ෂණයක් සඳහා උපකාර කිරීම හෝ විමර්ශණය කිරීම
- මහජන සෞඛ්‍යය, හෝ එක් හෝ වැඩි දෙනෙකුගේ ජීවිතය හෝ ආරක්ෂාව රැක ගැනීම
- *Census and Statistics Act 1905* (*1905 ජන ලේඛණ සහ සංඛ්‍යාලේඛණ පනත*) හෝ *Australian Bureau of Statistics Act 1975* (*1975 සංඛ්‍යාලේඛණ කාර්යාංශ පනත*) යටතේ සංඛ්‍යා ලේඛණ රැස්කිරීම හෝ නිරවද්‍යතාවය බැලීම
- රජයේ ආදායම ආරක්ෂා කිරීම
- පුද්ගලයෙකු හඳුනා ගැනීම හෝ ඔවුන්ගේ පුරවැසිබව හෝ වීසා බලපත්‍ර තත්වය සනාථ කර ගැනීම
- ඕස්ට්‍රේලියානු පුරවැසියන් නොවන අයට සේවා ලබාදීම
- ජාතික මත්ද්‍රව්‍යවලට එරෙහි වැඩපිළිවෙල පරිපාලනය
- ඕස්ට්‍රේලියාව සහ විදේශ රටක් අතර සංක්‍රමණ, නිරෝධායන හෝ දේශසීමා පාලන අරමුණකට සම්බන්ධ කරුණක්
- Customs Act (රෙගු පනත), Migration Act (සංක්‍රමණ පනත), Maritime Powers Act (සමුද්‍රීය බලතල පනත), Citizenship Act (පුරවැසි පනත), IGOC Act (IGOC පනත) ආදී පනත් මගින් ආවරණයවූ කරුණු සම්බන්ධයෙන්
- ආරක්ෂක හෝ ජාතික ආරක්ෂාව සම්බන්ධ අරමුණක්.

අදාල පුද්ගලයා විසින් හෙළිදරව් කරීමට කැමැත්ත ලබාදුනහොත්, පුද්ගලයෙකුගේ ජීවිතයට හෝ සෞඛ්‍යයට සිදුවන දරුණු තර්ජනයක් වැළැක්වීමට හෝ අඩු කිරීමට හෙළිදරව් කිරීම අවශ්‍ය වන අවස්ථාවක හෝ අදාල තොරතුරු දැනටමත් ප්‍රසිද්ධියේ නීත්‍යානුකූලව ලබාදී ඇති අවස්ථාවලද දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂිත පුද්ගලික තොරතුරු හෙළිදරව් කල හැකිය.

දේශසීමා ආරක්ෂණ පනතේ 51වන වගන්තිය මගින් ප්‍රතිපාදන සපයා ඇති ආකාරයට පනත් 6වන කොටසේ යම් ප්‍රතිපාදනවලට අනුකූලව කරන ලද සමහර හෙළිදරව් කිරීම් පුද්ගලිකතා පනතේ අරමුණු සඳහා කල හෙළිදරව් කිරීම් වශයෙන් සලකනු ලැබේ.

තවද, දෙපාර්තමේන්තුව සඳහා බලයලත් පුද්ගලයාගේ රැකියාවට හෝ සේවාවට අදාල වන අවස්ථාවලදී දේශසීමා බලකා පනත යටතේ සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂණ තොරතුරු හෙළිදරව් කරීමට අවසර ඇත. එවැනි කිසියම් හෙළිදරව් කිරීමක් පුද්ගලිකතා පනතට අනුකූලවන බවට දෙපාර්තමේන්තුව වග බලා ගන්නවා ඇත.

රෙගු පනත සහ රෙගුලාසි වැනි රෙගු ආශ්‍රිත ව්‍යවස්ථාවල දක්වා ඇති ආකාරයට සීමිත අවස්ථාවලදී ආරක්ෂිත තොරතුරු වන පුද්ගලික තොරතුරු දෙපාර්තමේන්තුව මගින් හෙළිදරව් කිරීමටද බලය ඇත.

## ගමන් කිරීමේ වාර්තා හෙළිදරව් කිරීම

ඕස්ට්‍රේලියාවේ සිට සහ ඕස්ට්‍රේලියාවෙන් ඉවතට යන සංචාරකයන්ගේ වාර්තා ගමන් කිරීමේ වාර්තා දත්ත ගබඩාවක (ඔමවඑමඑනට රුඑඑඔරඩස ඩඅටඅබඅසඑ) තැන්පත් කර ඇත. පහත අරමුණු වෙනුවෙන් එවා හෙළිදරව් කල හැකිය:

- සංක්‍රමණ පනත
- *Family Law Act 1975 (1975 පවුල් නීති පනත)*
- රෙගු හෝ සුරාබදු නීති
- නිරෝධායන හෝ සෞඛ්‍යය නීති
- නීතිය බලාත්මක කිරීම
- *Education Services for Overseas Students Act 2000 (2000 විදේශ ශිෂ්‍යයන් සඳහාවූ අධ්‍යාපන සේවා පනත)*
- පළමු නිවෙස් හිමිකරු වැඩසටහන හෝ ළමා සහ/හෝ සුබසාධන වැඩසටහන් පරිපාලනය කිරීම වැනි නියම කරන ලද කොමන්වෙල්ත්, ප්‍රාන්ත හෝ ටෙරිටරි ව්‍යවස්ථා.

## නීතිය බලාත්මක කිරීම සහ අදාල අරමුණු වෙනුවෙන් කරන හෙළිදරව් කිරීම

නීතිය බලාත්මක කිරීම සහ අදාල අරමුණු වෙනුවෙන් (සංක්‍රමණ සහ පුරවැසි පනත් යටතේ කරන නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් සහ බලාත්මක කරන ක්‍රියාකාරකම් හෝ වෙනත් බලාත්මක කරන ආයතන ඇතුළුව) දෙපාර්තමේන්තුව මගින් කරන සාමාන්‍ය හෙළිදරව් කිරීම් අතර පහත දේ ඇත:


© COMMONWEALTH OF AUSTRALIA, 2020

- චරිතය සම්බන්ධ අවශ්‍යතා ඇගයීමට සහ බලාත්මක කිරීම සඳහා ඕස්ට්‍රේලියානු සහ විදේශ නීති බලාත්මක කරන ආයතන
- සංක්‍රමණ වංචා, ජාතික ආරක්ෂාව සම්බන්ධ ගැටළු, හෝ යුධ අපරාධ හෝ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් සැකකරන අවස්ථා හඳුනා ගැනීමට හෝ විමර්ශනය කිරීමට ඕස්ට්‍රේලියානු සහ විදේශ නීති බලාත්මක ආයතන සහ බුද්ධිමය ආයතන හෝ කොමිසම්, ජාතික පොදු පොලිස් සේවා, ඉන්ටර්පෝල්, ජාතික දේශසීමා ඉලක්ක මධ්‍යස්ථානය, ක්‍රිම් ට්‍රැක්, ඔස්ට්‍රැක්, නියාමක කොමිසම්, පාර්ලිමේන්තු විමසීම් කොමිසම්, ජාත්‍යන්තර විනිශ්චය අධිකාරී සහ විදේශ සංක්‍රමණ අධිකාරී
- *Law Enforcement Integrity Commissioner Act 2006* (*2006 නීතිය බලාත්මක කිරීමේ ඒකාග්‍රතා කොමසාරිස් පනත*) පරිපාලනය කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ ඕස්ට්‍රේලියානු ඒකාග්‍රතා කොමසාරිස්
- රාජකාරී කිරීම සම්බන්ධ වීසා බලපත්‍ර කොන්දේසි කඩ කරන අයව සොයා ගැනීමට ATO, DHS සහ වෙනත් කොමන්වෙල්ත් හෝ ප්‍රාන්ත සහ ටෙරිටරි ආයතන
- නීතිවිරෝධී පුරවැසියන්ව සොයා ගැනීම සඳහා AFP සහ ඕස්ට්‍රේලියානු පොලිස් සේවා
- සංක්‍රමණ හෝ පුරවැසි වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු සඳහා රජයේ නඩු අධ්‍යක්ෂක
- නීතිවිරෝධී පුරවැසියෙකුව රටින් ඉවත් කිරීම සඳහා විදේශ රජයන්
- වීසා බලපත්‍රවල කොන්දේසිවලට අනුකූලව කටයුතු කරනවාද යන්න අධීක්ෂණය කිරීම, සහ අනුග්‍රාහක වගකීම් සහ සම්බාධක පැනවීම සම්බන්ධයෙන් දැනුම්දීම සඳහා FWO, ලියාපදිංචි අධ්‍යාපන ආයතන, සේවායෝජකයන්, අනුග්‍රාහය ලබාදුන් පුද්ගලයන්, අනුග්‍රාහකයන් සහ කම්කරුවන් සපයන්නන්
- නීතිය බලාත්මක කිරීම හෝ ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටළු හඳුනා ගැනීම සඳහා වීසා බලපත්‍ර අයදුම්කරුවන් සහ සරණාගත සහ මානුෂික වැඩසටහන යටතේ යෝජනා කරන්නන් සම්බන්ධ තොරතුරු AFP ඇතුළු නීතිය බලාත්මක කරන ආයතන වෙත

## නීතිය බලාත්මක කිරීමේ ආයතනයක් ලෙස දෙපාර්තමේන්තුව මගින් කරන හෙළිදරව් කිරීම්.

පහත පනත් යටතේ සමහර අරමුණු වෙනුවෙන් දෙපාර්තමේන්තුව නීතිය බලාත්මක කරන ආයතනයක්වේ: *Crimes Act 1914* (*1914 අපරාධ පනත*), *Criminal Code Act 1995* (*1995 අපරාධ සංග්‍රහ පනත*), ං‍උසටරඅලඉඅන ෘාඋලඑඅර,ුඑඉඑනඑඑ අනඩ *Technology Organisation Act 1987* (the ANSTO Act) (*1987 ඕස්ට්‍රේලියානු න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණික සංවිධාන පනත* (ඇන්ස්ටෝ පනත)) සහ *Independent National Security Legislation Monitor Act 2010* (*2010 ස්වාධීන ජාතික ආරක්ෂක ව්‍යවස්ථා උපදේශක පනත*), සහ එම පනත් යටතේ සිය කටයුතු සහ ක්‍රියාකාරකම් ඉටුකිරීමට පුද්ගලික තොරතුරු හෙළිදරව් කල හැකිය.

## වැඩසටහන් කළමණාකරණය අදාලව වෙනත් හෙළිදරව් කිරීම්

### උපකාර සහතික කිරීම (Assurance of support)

ගෙවන ලද බැඳුම්කර නිදහස් කිරීම පහසු කිරීම සහ ඇතිවූ ණය පියවා ගැනීම සඳහා, උපකාර සහතික කිරීම ලබාදෙන අය සම්බන්ධ තොරතුරු, සෙන්ටර්ලින්ක් වෙත හෙළිදරව් කරනු ඇත.

### සේවායෝජක, කම්කරුවන් සැපයීම සහ ව්‍යාපාර කුසලතා

කම්කරුවන් සපයන වැඩපිළිවෙලක් යටතේ ඔබගේ සේවා උපයෝගී කර ගන්නා සේවායෝජකයන්, කම්කරුවන් සපයන්නන් සහ තුන්වන පාර්ශවයන් හට දෙපාර්තමේන්තුව මගින් ඔබගේ සංක්‍රමණ තත්වය, රැකීරක්ෂා කිරීමට ඇති අයිතිය සහ ඔබගේ වීසා බලපත්‍රයේ කාලසීමාව සම්බන්ධයෙන් හෙළිදරව් කල හැකිය. උදාහරණ වශයෙන් ඔබ රැකියා සඳහා අයදුම් කරන විට, සේවායෝජකයා හෝ කම්කරුවන් සපයන අය හට දෙපාර්තමේන්තුව මගින් ඔබට වැඩ කිරීමට ඇති අයිතිය සම්බන්ධයෙන් හෙළිදරව් කල හැකිය.

ව්‍යාපාර කුසලතා සංක්‍රමණිකයන් හට රජයේ ව්‍යාපාර තොරතුරු සේවා ලබා ගැනීමට උපකාර කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් ප්‍රාන්ත සහ ටෙරිටරි ආර්ථික සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත තොරතුරු හෙළිදරව් කල හැකිය.

### පුහුණුව සහ අධ්‍යාපනය

පහත ආයතන වෙත පුද්ගලික තොරතුරු හෙළිදරව් කල හැකිය:

- පුහුණුවීම් ලබා ගැනීමට හෝ ඕස්ට්‍රේලියාවේ ඉගෙනීමට බලාපොරොත්තුවන අයහට උපකාර කිරීමට DFAT, කර්මාන්ත දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- ඕස්ට්‍රේලියානු කම්කරු වෙළඳපොල සම්බන්ධ යෝජිත වැඩකරන ස්ථාන අංගයක් සම්බන්ධයෙන් ඇති බලපෑම නිර්ණය කිරීමට රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
- සමහර වීසා පංති සම්බන්ධයෙන් විදේශ සුදුසුකම් ඇගයීම් කරන අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ අභියෝජනය කල අධිකාරීන්
- වැඩිහිටි සංක්‍රමණ ඉංග්‍රීසි වැඩසටහන (Adult Migrant English Program) යටතේ ඉංග්‍රීසි භාෂා අමතර ඉගැන්වීම් සපයාදෙන අධ්‍යාපන ආයතන
- අධ්‍යාපනය සපයන්නන් විධිමත් කිරීමේ අරමුණු වෙනුවෙන් රජයේ ආයතන.

### සෞඛ්‍යය

වීසා බලපත්‍ර ප්‍රදානය සඳහා සෞඛ්‍යය අවශ්‍යතා සපුරාලන්නේද, සෞඛ්‍යය අවශ්‍යතාවය සපුරාලීම අත්හැරිය යුතුද යන්න සලකා බැලිය යුතුද, නැතිනම් මහජන සෞඛ්‍යය අවදානම් කළමණාකරණය කල යුතුද යන්න නිර්ණය කිරීම සඳහා උපකාර කිරීමට ඔබගේ සහ ඔබගේ පවුලේ සාමාජිකයන්ගේ වීසා බලපත්‍ර සම්බන්ධ සෞඛ්‍යය ඇගයීම, රජයේ සෞඛ්‍යය ආයතන සහ වෛද්‍ය සේවා සපයන්නන් හට හෙළිදරව් කල හැකිය.

### සරණාගත සහ මානව හිතවාදී ලෙස ඇතුළුවීම, සහ මෙතෙර ආරක්ෂාව

සරණාගතයන් සහ මානව හිතවාදී ලෙස ඇතුළුවන්නන් සහ ඔවුන්ව යෝජනා කරන අය (අදාල වන්නේ නම්) සම්බන්ධ පුද්ගලික තොරතුරු දෙපාර්තමේන්තුව මගින් මානව හිතවාදී ආකාරයට පදිංචිවීමේ සේවා යටතේ ගිවිසුම් සේවා සපයන්නන් සමඟ හුවමාරු කරගත හැකිය.

අනන්‍යතාවය තහවුරු කිරීමේ සහ මානව හිතවාදී හෝ ආරක්ෂණ ඉල්ලීම් තහවුරු කර ගැනීමේ අරමුණු වෙනුවෙන් දෙපාර්තමේන්තුව මගින් සරණාගතයන් සහ ආරක්ෂාව සඳහා අයදුම්කර සිටින අයගේ පුද්ගලික තොරතුරු සරණාගතයන් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් (United Nations High Commissioner for Refugees (UNHCR)) වෙත ලබාදිය හැකිය.

සංක්‍රමණය සඳහාවූ ජාත්‍යන්තර සංවිධානය හට සිය සේවා සැපයීම පහසු කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් පුද්ගලික තොරතුරු ලබාදිය හැකිය.

### රැඳවුම

දෙපාර්තමේන්තුව මගින් සංක්‍රමණ රැඳවුම්කරුවන්ගේ පුද්ගලික තොරතුරු පහත ආයතන වෙත ලබාදිය හැකිය:

- විකල්ප රැඳවුම් වැඩපිළිවෙලවල්, දෙමාපියන් සමග නොමැති බාලවයස්කරුවන් හෝ කායික සහ මානසික සෞඛ්‍යය දුබලතාවයන් ඇති රැඳවුම්කරුවන්ගේ භාරකරුවන්ගේ රැකවරණය සම්බන්ධයෙන් ප්‍රාන්ත සහ ටෙරිටරි සුබසාධන ආයතන
- හුවමාරු කිරීම් සහ සංක්‍රමණ තත්වය සනාථ කිරීම පහසු කිරීම සඳහා ප්‍රාන්ත සහ ටෙරිටරි නිවැරදි කිරීමේ සේවා (correctional services)
- හුවමාරු කිරීම සම්බන්ධයෙන් එතෙර සැකසුම් සේවා සපයන්නන්
- ඔබට සේවා සපයන හෝ ඔබට හෝ ඔබගේ පවුලේ අයහට රටින් පිටත්ව යාමේ විකල්ප ඇගයීමට උපකාර කරන පාසැල්, වෛද්‍ය වෘත්තිකයන් සහ සෞඛ්‍යය සහ සුබසාධන සේවා සපයන්නන්, හෝ සංක්‍රමණ උපදේශකයන්.

### ළමුන්ගේ සුබසාධනය සහ ආරක්ෂාව

පහත කරුණු සම්බන්ධයෙන් දරුවන්, සහ/හෝ දරුවන්ගේ දෙමාපියන්/භාරකරුවන්/රැකවරණකරුවන් සම්බන්ධ පුද්ගලික තොරතුරු ළමා සුබසාධන සහ ආරක්ෂණ ආයතන, ප්‍රාන්ත/ටෙරිටරි ළමා සුබසාධන ආයතන, ප්‍රාන්ත ටෙරිටරි පොලිස් හෝ වෙනත් අදාල රජයේ ආයතන වෙත හෙළිදරව් කල හැකිය:

- සංක්‍රමණ රැඳවුමේ සහ/හෝ ප්‍රජාව තුල රැකවරණ සහ සුබසාධන වැඩපිළිවෙලවල් සංවිධානය සහ අධීක්ෂණය කිරීම
- සිදුවිය හැකි අපචාරය හෝ නොසලකා හැරීම ආදිය විමර්ශනය කිරීම
- ගමන් වැඩපිළිවෙලවල් සහ ලියකියවිලි ලබා ගැනීම පහසු කිරීම.

දරුකමට හදා ගැනීම සඳහා ඕස්ට්‍රේලියාවට ඇතුළුවන දරුවන් සම්බන්ධ තොරතුරු ප්‍රාන්ත සහ ටෙරිටරි සුබසාධන සංවිධාන, ඕස්ට්‍රේලියාවේ මධ්‍යම දරුකමට හදා ගැනීමේ අධිකාරී (Central Adoption Authorities) සහ ඕස්ට්‍රේලියාවේ රටවල් අතර දරුකමට හදාගැනීම (Intercountry Adoption Australia) වෙත හෙළිදරව් කල හැකිය.

### ගමන් ලියකියවිලි ලබා ගැනීම සඳහා තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල සහ කොන්සියුලේට් කාර්යාල හට තොරතුරු ලබාදීම

ඔබ රටින් පිටත්ව යාමේ පදනම මත වීසා බලපත්‍රයක් නිකුත් කර ඇතිනම් හෝ ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට නීත්‍යානුකූල පදනමක් නැතිනම් ඔබ පිටත්ව යායුතු බවට අපේක්ෂා කෙරේ. ඔබට වලංගු ගමන් බලපත්‍රයක් නැතිනම් හෝ සාධාරණ කාලසීමාවක් ඇතුලත වලංගු ගමන් බලපත්‍රයක් ලබා ගන්නේ නොමැතිනම්, සාමාන්‍ය වශයෙන් සිදුවන්නේ දෙපාර්තමේන්තුව මගින් ඔබ වෙනුවෙන් ගමන් බලපත්‍රයක් අයදුම් කර සිටීමයි. මේ මගින් ඔබගේ පිටත්ව යාම පිළියෙල කිරීමට ඉඩකඩ ලබාදේ.

අදාල තානාපති කාර්යාලය, මහ කොමසාරිස් කාර්යාලය හෝ කොන්සියුලේට් කාර්යාලය මගින් ගමන් ලියවිල්ලක් ලබාදීම පහසු කිරීම සඳහා අවශ්‍ය අවම තොරතුරු පමණක් දෙපාර්තමේන්තුව මගින් ලබාදෙනු ඇත. මේවා අතර ඔබගේ නම, ඔබගේ වර්තමාන ගමන් බලපත්‍රයේ හෝ වෙනත් හඳුනා ගැනීමේ ලියවිලිවල තොරතුරු සහ ඔබ හා සම්බන්ධවීමේ ෙ තාරතුරු ඇතුලත්වේ.

### පුරවැසිබව

දෙපාර්තමේන්තුව මගින් පුද්ගලික හඳුනා ගැනීම් හැර පුද්ගලික තොරතුරු පහත ආයතන වෙත ලබාදිය හැකියඃ

- පුරවැසි උත්සව පැවැත්වීමේ අරමුණ වෙනුවෙන් පළාත් පාලන ආයතන සහ වෙනත් සංවිධාන
- ඕස්ට්‍රේලියානු ගෞරව ප්‍රණාම අයදුම්පත්‍ර සලකා බැලීම සඳහා අග්‍රාණ්ඩුකාරවරයාගේ නිළ ලේකම් කාර්යාලය සහ අග්‍රාමාත්‍ය සහ කැබිනට් මණ්ඩල කාර්යාලය
- නව පුරවැසියන් ඕස්ට්‍රේලියානු ප්‍රජාව වෙත පිළිගැනීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන සභිකයන්.

### සංක්‍රමණ පර්යේෂණ

වර්තමාන සහ අතීත සේවාදායකයන් සම්බන්ධ සමීක්ෂණ සඳහා පුද්ගලික තොරතුරු උපකාරී කර ගත හැකිය. පර්යේෂණ, ප්‍රතිපත්ති සහ/හෝ සංවර්ධන කටයුතු විමර්ශනය සහ විශ්ලේෂණය කිරීමේ අරමුණින් වෙනත් ආයතන සහ ගිවිසුම්ගත තුන්වන පාර්ශවයන් හට පුද්ගලික තොරතුරු ලබාදිය හැකිය. ගිවිසුම් මගින් අදාල තොරතුරු භාවිතා කිරීම දක්වන ලද පර්යේෂණ කටයුතුවලට සීමා වන අතර, අදාල කටයුත්ත සම්පූර්ණ කිරීමෙන් පසු අදාල තොරතුරු විනාශකර දැමීම අවශ්‍යවේ. පර්යේෂණවලට උපයෝගී කරගත් රැස්කරගත් දත්ත ප්‍රකාශයට පත් කිරීමට පෙර හඳුනාගත නොහැකි ආකාරයට සකස් කරනු ඇත.

අළුතින් පැමිණි අය සම්බන්ධ ජන විකාශන පර්යේෂණ සහ විවිධ සංක්‍රමණ වැඩසටහන් සහ පදිංචිකරවීමේ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම පහසු කිරීම සඳහා පුද්ගලික තොරතුරු ඕස්ට්‍රේලියානු සංඛ්‍යාලේඛණ බියුරෝවට හෙළිදරව් කල හැකිය.

පදිංචි කරවීම සැලසුම් කිරීමට සහ පදිංචි කරවීමේ සේවා ලබාදීම සඳහා අළුතින් පැමිණි අය සම්බන්ධ තොරතුරු ප්‍රාන්ත සහ ටෙරිටරි ආයතන හෝ සංක්‍රමණ සේවා සංවිධාන වෙත ලබාදිය හැකිය.

## ප්‍රධාන ජාත්‍යන්තර ඉසව්

ප්‍රධාන ක්‍රීඩා තරඟ; ජාත්‍යන්තර රාජ්‍ය නායක රැස්වීම්; ලෝකයේ සමාජ, සංස්කෘතික හෝ ආගමික හමු හෝ උත්සව වැනි ප්‍රධාන ජාතන්තර ඉසව් සම්බන්ධීකරණය කිරීමේ කාර්‍යභාරය ඇති ප්‍රාන්ත සහ ටෙරිටරි ආයතන ඇතුළු ඕස්ට්‍රේලියානු රජයේ ආයතන වෙත පුද්ගලික තොරතුරු හෙළිදරව් කල හැකිය.

ඔබගේ වැඩපිළිවෙලවල් පහසු කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් සංවේදී නොවන තොරතුරු භාවිතා කිරීම සහ ඕස්ට්‍රේලියානු සහ ජාත්‍යන්තර සංවිධාන, සහ වෙනත් රටවල් වෙත හෙළිදරව් කිරීම කල හැකිය.

## දෙපාර්තමේන්තුවේ පුද්ගලිකතා ප්‍රතිපත්තිය සම්බන්ධ තොරතුරු

දෙපාර්තමේන්තුවේ පුද්ගලිකතා ප්‍රතිපත්තිය දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ **https://www.homeaffairs.gov.au/access-and-accountability/our-commitments/privacy** වෙතින් ලබාගත හැකිය.

ප්‍රතිපත්තියට පහත තොරතුරු ඇතුලත්වේඃ

- දෙපාර්තමේන්තුව සතුව ඇති ඔබගේ පුද්ගලික තොරතුරු වෙත ඔබට ප්‍රවේශ විය හැකි ආකාරය සහ ඒවා නිවැරදි කරගත හැකි ආකාරය
- පුද්ගලිකත්වය උල්ලංඝණය කිරීමක් සම්බන්ධයෙන් ඔබ හට පැමිණිලි කල හැකි ආකාරය සහ දෙපාර්තමේන්තුවේ පැමිණිලි හසුරුවන ක්‍රියාපටිපාටිය.

## ඔබගේ තොරතුරු විදේශ ප්‍රතිග්‍රාහකයන් හට හෙළිදරව් කිරීම

දත්ත යැවීමට සහ ගබඩා කර තැබීමට දෙපාර්තමේන්තුව එතෙර සිටින සැපයුම්කරුවන් ඇතුළු බාහිර පරිගණක තාක්ෂණ ගිවිසුම්කරුවන් උපයෝගී කර ගනී.

සමහර අවස්ථාවල අපි විදේශ ප්‍රතිග්‍රාහකයන් හට පුද්ගලික තොරතුරු හෙළිදරව් කරමු. බොහෝ අවස්ථාවල මෙම ප්‍රතිග්‍රාහකයන් ඔබ සාමාන්‍ය වශයෙන් ජීවත්වන රට හෝ ඔබට පිටත්ව පැමිණි රටවේ (ඔබ එම රටවලට එරෙහිව ආරක්ෂණ ඉල්ලීම් ඉදිරිපත්කර නොමැතිනම් සහ, එම ඉල්ලීම් සම්බන්ධ සලකා බැලීම් අවසාන වන තෙක් බලා සිටින්නේ නැතිනම්). දියුණු මගී පිරිසැකසුම් (advanced passenger processing) සහ ඉලෙක්ට්‍රොනික් වීසා බලපත්‍ර පිරිසැකසුම් (electronic visa processing) සම්බන්ධයෙන් ගුවන් සේවා හෝ ගමන් නියෝජිතයන් හට හෙළිදරව් කිරීම් මෙයට ඇතුලත්වේ.

ඕස්ට්‍රේලියාව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගිවිසුම් ඇති, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, කැනඩාව සහ නවසීලන්තය ඇතුළු (මෙම රටවලට පමණක් සීමා නොවේ) රටවල් හෝ ජාත්‍යන්තර සංවිධාන සමඟද දෙපාර්තමේන්තුව තොරතුරු හුවමාරු කර ගනී.
මෙම තොරතුරු හුවමාරුකර ගැනීම්වලට ජීවමිතික දත්ත (පුද්ගලික හඳුනාගැනීම්) බෙදාහදා ගැනීමද ඇතුලත්වේ.

ඔබගේ පුද්ගලික හඳුනාගැනීම් සම්බන්ධ ගැලපීමක් ඇතිනම්, දෙපාර්තමේන්තුව මගින් ඔබගේ ජීවමිතික දත්ත, ගමන් සහ වෙනත් හඳුනා ගැනීමේ ලියකියවිලි හෝ එවැනි ලියකියවිලිවල ඇති තොරතුරු, ඔබගේ සංක්‍රමණ තත්වය සහ සංක්‍රමණ ඉතිහාසය (ඕනෑම සංක්‍රමණ වංචාවක් සහ අපරාධ වැරදි ඇතුළුව) සහ ඕනෑම අපරාධ ඉතිහාසය සම්බන්ධ තොරතුරු හෙළිදරව් කල හැකිය.

එවැනි හෙළිදරව් කිරීමක අරමුණ වන්නේ ඔබගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමට උපකාර කර ගැනීම සහ ඔබ විසින් වෙනත් ආයතන වෙත එකම අනන්‍යතාවය සහ සමාන ආකාරයේ ඉල්ලීම් ඉදිරිපත් කර ඇතිද යන්න නිර්ණය කිරීමවේ.

යම් නිශ්චිත රටක රජයකට එරෙහිව ඉල්ලීම් පදනම්කර ඔබ එතෙර මානව හිතවාදී හෝ ආරක්ෂණ වීසා බලපත්‍ර අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරයි නම්, දෙපාර්තමේන්තුව ඔබ ඕස්ට්‍රේලියාවේ සිටීනම් සහ පහත අවශ්‍යතා සපුරන්නේ නම් මිස, එම රජයට ඔබගේ පුද්ගලික තොරතුරු හෙළිදරව් කරන්නේ නැතඃ

- ඔබ එම රටට නැවත යාමට එකඟවී ඇතිනම් හෝ ඉල්ලා සිටීනම්, හෝ
- ඕස්ට්‍රේලියාව සතුව ඔබ වෙත ආරක්ෂණ වගකීම් නොමැති බව සොයාගෙන ඇතිනම්.

| | |
|---|---|
| *නිවෙස් පිටුව* | **www.homeaffairs.gov.au** |
| *සාමාන්‍ය විමසීම් දුරකථන අංකය* | දුරකථන ක්‍රියාකරුවෙකු හට කථා කිරීමට කාර්‍යාල වේලාවලදී දුරකථන අංක **131 881** අමතන්න (කාර්‍යාල වේලාවලින් පිටතදී තැටිගතකල තොරතුරු ඇත). ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත සිටීනම්, ඔබට සමීපම ඕස්ට්‍රේලියානු දූත මෙහෙවර හා සම්බන්ධ වන්න. |


© COMMONWEALTH OF AUSTRALIA, 2020